**මඩුල්ල ප්‍රාදේශීය සභාව - 2022**

**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත .

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය සඳහා ලද රු. 13,331,465 ක මුදල මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනයේ ප්‍රාග්ධන ලැබීම් ලෙස දක්වා නොතිබුණු අතර ඉන් වැයකර තිබුණු රු. 14,429,080 ක වියදම ද මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනයට ඇතුලත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂවල ගිණුම් සකස් කිරිමේ දී එවැනි වැරදි සිදු නොවීමට කටයුතු කරන බව කාරුණිකව දැනුම් දෙමි. | සමාලෝචිත වර්ෂයේ ආදායම් වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය තුළ ලද රු.109,750 ක සෘජු ප්‍රේෂණ හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය තුළ ලද සෘජු ප්‍රේෂණය මාර්තු මාසයේ දී හඳුනාගත් බැවින් එම මාසයේ ආදායමට ගත් බව දන්වමි. | සෘජු ප්‍රේෂණ කාලීනව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | කඩ කාමර බදු දීමේදී අයකරනු ලබන ආපසු නොගෙවන මූලික තැන්පත් මුදල් 2020 වර්ෂයේ සිට පොදු තැන්පත් ලේඛනයට ඇතුලත් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ශේෂය රු.2,543,196 ක් වැඩියෙන් දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ආදායම රු.1,571,528 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | දැනට තැන්පත් ලේඛනයේ පවතින රු.1571528 ආදායමට ගැනීමට කටයුතු කර ඇති බව බව දන්වමි. | ආදායම් හා තැන්පත් ශේෂ නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගතකළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 182,255 ක ඉතිරි වීථි ලාම්පු උපකරණ තොගය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයට ඇතුලත් කර නොතිබුණි. | ඉදිරි ගිණුම් සකස් කිරිමේ දී වීථි ලාම්පු තොග ද ඉතිරි තොගයට ඇතුළත් කර ගන්නා බව කාරුණිකව දන්වමි. | නිවැරදිව තොග වටිනාකම් ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය යටතේ මිලදී ගන්නා ලද කාර්යාල උපකරණ සහ ලී බඩු උපකරණවල වටිනාකම රු.676,109 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් සකස් කිරිමේ දී එම වටිනාකම ලීබඩු හා උපකරණ වටිනාකමට එකතු කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම් පිලියෙල කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ මඩුල්ල ළමා උද්‍යානය සඳහා මිලදි ගෙන තිබුණු රු.500,000 ක් වටිනා හංස බෝට්ටු, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ සහ ඉඩම් ගොඩනැගිලි යටතේ දෙවතාවක් ප්‍රාග්ධනිත කර තිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම් සකස් කිරිමේ දී මෙම වරද නිවැරදි කරන බව කාරුණිකව දන්වා සිටිමි. | ද්විගණන දෝෂ ඇති නොවන පරිදි ගිණුම් පිලියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | සමාලෝචිත වර්ෂය තුල වැඩ අවසන් කරන ලද එකතු වටිනාකම රු.2,283,541 ක් වූ කර්මාන්ත 02 ක් දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගතකර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ දී කර්මාන්ත වටිනාකම ගිණුම් ගත කරන බව කාරුණිකව දන්වා සිටිමි. | වර්ෂය තුළ වැඩ අවසන් කරන ලද කර්මාන්ත වටිනාකම ගිණුම් ගත කළ යුතුය. |
| (ඌ) | ප්‍රාදේශීය සභාවට අයත් සංචාරක නිකේතනය වැඩි දියුණු කිරීමට අදාලව 2021 වර්ෂයේ ප්‍රාග්ධනිත කළ රු.2,271,675 ක් සහ කහගොල්ල බුලත්වැල්ආර ජල ව්‍යාපෘතිය සඳහා වැයකර තිබුණු රු.698,795 ක් සමාලෝචිත වර්ෂයේ නැවත ප්‍රාග්ධනිත කර තිබුණි. | වැඩියෙන් ප්‍රාග්ධනිත කළ මුදල ඉදිරි වර්ෂයේ දී ඉවත් කරන බව දන්වමි. | ද්විගණන දෝෂ ඇති නොවන පරිදි නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (එ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත 02 ක් වෙනුවෙන් ගෙවිය යුතු එකතුව රු.498,991 ක් සහ හිඟ කඩ කාමර දඩ රු.100,092 ක් මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම් සැකසීමේ දී මෙම වරද නිවැරදි කර ගන්නා බව දන්වා සිටිමි. | සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු වටිනාකම් සඳහා ප්‍රතිපාදන වෙන් කළ යුතු අතර සියලු ලැබිය යුතු ආදායම් ගිණුම් ගත කළ යුතුය. |

### 1.6.2 අධිකාරි බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 සිට 2019 දක්වා සහ 2021 කාල පරිච්ඡේදයට අදාලව පරිසර ආරක්ෂණ බලපත්‍ර සමීක්ෂණ ගාස්තු වලින් සියයට 50 ක දීමනාවක් ලෙස විධිමත් අනුමැතියකින් තොරව නිලධාරීන්ට ගෙවා තිබුණු රු.108,250 ක් 2022 දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | අනුමැතියකින් තොරව නිළධාරීන්වෙත ගෙවා ඇති පරිසර ආරක්ෂණ බලපත්‍ර සමීක්ෂණ ගාස්තු වාරික වශයෙන් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. | විධිමත් අනුමැතියක් ලබාගෙන දීමනා ගෙවිය යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතු වටිනාකම රු. 442,915,431 ක් වූ වත්කම් විෂයයක් සහ වගකීම් විෂයයන් 02 ක් සම්බන්ධයෙන් වෘත්තීය තක්සේරුකරුවන්ගේ වාර්තා, හිමිකම් ඔප්පු සහ ලේඛනය ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඉඩම් සම්බන්ධයෙන් වෘත්තිය තක්සේරුවක් කිරීමටත් ලේඛන සහ උපලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යාමටත් කටයුතු කරන බව දන්වමි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති චක්‍රලේඛය | සභාව විසින් පවත්වාගෙන තිබුණු වීථි පහන් ලේඛනය අනුව, බලප්‍රදේශයේ වීථි පහන් 1276 ක් සවිකර තිබුණද, වීථි ආලෝකකරණය සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගතවී නොතිබුණි. | වීථි පහන් ආලෝකකරණය සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ඉදිරියේ දී ගිවිසුම් ගත වීමට සාකච්ඡා මට්ටමේ පවතින බව කාරුණිකව දන්වමි. | චක්‍රලේඛය ප්‍රකාරව ගිවිසුමකට එළඹිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 3,002,306 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 6,778,709 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු |
| වරිපනම් | 194,400 | 226,500 | 226,500 | - | 194,400 | 156,900 | 156,900 | - |
| හා බදු කුලී | 6,658,931 | 7,048,711 | 6,643,767 | 404,944 | 19,866,100 | 8,109,700 | 2,177,916 | 5,931,784 |
| බලපත්‍ර ගාස්තු | 699,400 | 254,027 | 255,176 | -1,149 | 769,430 | 211,706 | 196,708 | 14,998 |
| වෙනත් ආදායම් | 15,266,900 | 10,851,502 | 7,969,816 | 2,881,685 | 9,043,520 | - | 10,001,963 | 10,001,963 |
| එකතුව | 22,819,631 | 18,380,740 | 15,095,259 | 3,285,480 | 29,873,450 | 8,478,306 | 12,533,487 | 15,948,745 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ බිල්කරන ලද රු. 18,380,740 ක් වූ මුළු ආදායමින් වර්ෂය අවසාන වන විට රු.3,285,480 ක් අයකර නොතිබුණු අතර එය මුළු බිල්කල ආදායමෙන් සියයට 18 ක් විය. | හිඟ ආදායම් රැස්කර ගැනීමට ඉදිරියේ දී කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ බදු දී තිබුණු කඩ කාමර 28 කින් අයවිය යුතු රු.561,000 ක් වූ කඩ කාමර කුලී ආදායමෙන් 2022 දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කාමර කුලි රු. 264,548 ක් අයකරගත යුතුව පැවතුණි. එය මුළු බිල් කළ ආදායමෙන් සියයට 47 ක් විය. | හිඟ කඩ කාමර කුලී කඩිනමින් අය කර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | හිඟ කඩ කුලී කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සභාව වෙත අයවිය යුතු රු.126,839 ක හිඟ ජල ගාස්තු අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් අය කර ගැනිම සඳහා කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 137,167 ක් සහ මුද්දර ගාස්තු රු.2,452,723 ක් විය. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු ඉදිරියේදි කඩිනමින් ලබා ගැනිම සඳහා කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | හිඟ මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් ගෙන්වා ගත යුතුය. |
| (ඉ) | 2017 සිට 2021 කාල පරිච්ඡේදයට අදාලව අයවිය යුතු රු.925,270 ක් සහ සමාලෝචිත වර්ෂයට අදාලව අයවිය යුතු රු.588,482 ක හිඟ යන්ත්‍ර කුලී ආදායම් 2023 පෙබරවාරි 07 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | හිඟ යන්ත්‍ර කුලී ඉදිරියේදී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටමි. | හිග යන්ත්‍ර කුලී ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ කටයුතු 2020 වර්ෂයේ දී ආරම්භකර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබාගෙන නොතිබුණි. | මධ්‍යම පරිසර අධිකාරිය මගින් ඝන අපද්‍රව්‍ය කලමනාකරණ මධ්‍යස්ථානය පරීක්ෂාවට ලක් කර ඇති අතර, ඔවුන් ඉදිරිපත් කර ඇති කොන්දේසි ක්‍රියාත්මක කිරීම සඳහා විශාල මුදලක් අවශ්‍ය බැවින් ප්‍රතිපාදන සපුරාගෙන පරිසර බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කරන බව දන්වමි. | ඝන අපද්‍රව්‍ය කලමනාකරණ මධ්‍යස්ථානය සඳහා පාරසරික ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකළ යුතු වුවත් මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2021 මැයි මාසයේදී දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන අදාල පාර්ශවයන්ගෙන් අනුමැතිය ලබාගෙන තිබුණද වරිපනම් බදු අය කිරීමක් සිදු කර නොතිබුණි. | මාගන්දන-දඹගල්ල ප්‍රදේශය දැනට දියුණු කළ ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ගැසට් කර ඇති අතර වරිපනම් බදු අය කිරීමට මේ වනවිට විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන ඇති බවත් දියුණු කළ ප්‍රදේශයේ සීමාවන් භෞතිකව සලකුණු කිරීමේ කටයුතු හා වාර වාර්තා කැඳවීමට අවශ්‍ය මූලික කටයුතු සැලසුම් කරමින් පවතින බවත් සඳහන් කරමි. | දියුණු කළ ප්‍රදේශ සම්බන්ධයෙන් වරිපනම් බදු ප්‍රකාශයට පත්කර ගාස්තු අයකළ යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් විවිධ ප්‍රමාණයන්ගෙන් යුතු ඉඩම් 26 ක මැනුම් කටයුතු සිදුකර නොතිබුණු අතර ඉඩම් 63 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාවට අයත් ඉඩම් හා සුසාන භූමි ඉඩම් මැනීමේ කටයුතු සිදු කර නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට ඉල්ලීම් කරමින් මඩුල්ල ප්‍රාදේශීය ලේකම්ට ලිපි යොමු කර ඇති බව කාරුණිකව සඳහන් කරමි. | සභාවට අයත් ඉඩම්වල මැනුම් කටයුතු සිදුකර නීත්‍යානුකූල අයිතිය ලබා ගත යුතුය. |
| (ආ) | සභාවට අයත් මහෙන්ද්‍රා කැබ් රථය 2021 දෙසැම්බර් 30 දින සිට අක්‍රීය වී ඇති අතර එය අලුත්වැඩියාව සඳහා පෞද්ගලික ගරාජයකට යොමුකර තිබුණි. 2023 අප්‍රේල් 27 දින වන විට අලුත්වැඩියාව සඳහා යොමුකර මාස 16 ක පමණ කාලයක් ගත වී තිබුණද කැබ් රථය අලුත්වැඩියා කර නොතිබුණි. | රථයේ අලුත්වැඩියා කටයුතු සඳහා පැමිණ පරික්ෂා කර බලා නිර්දේශයක් ලබාදෙන ලෙස පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ වෙත දැනුම් දී ඇති අතර නිර්දේශ ලැබුණු විගස රථය අලුත්වැඩියා කටයුතු සිදු කරන බව කාරුණිකව සඳහන් කරමි. | සභාව සතු වාහන කඩිනමින් අළුත්වැඩියා කර භාවිතයට ගත යුතු අතර ඒවායේ සුරක්ෂිතතාවය තහවුරුකරගත යුතුය. |
| (ඇ) | සභාවට අයත් ට්‍රැක්ටර් රථය 2022 නොවැම්බර් 15 දින සිට අක්‍රීය වී ඇති අතර 2023 අප්‍රේල් 27 දින වන විටත් මාස 06 කට ආසන්න කාලයක් ගත වී තිබුණද ට්‍රැක්ටර් රථය අලුත්වැඩියා කර නොතිබුණි. | අලුත්වැඩියා කිරිමට අදාලව මිල කැඳවුම් කිරිමට කටයුතු සිදු කරමින් පවති.අදාල මිල කැඳවුම් සිදු කිරිමෙන් අනතුරුව අලුත්වැඩියා කටයුතු කඩිනමින් සිදු කරන බව කාරුණිකව සඳහන් කරමි. | සභාව සතු වාහන කඩිනමින් අළුත්වැඩියා කර භාවිතයට ගත යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 02 කට අදාලව අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයින් 14 දෙනෙකුගේ අතිරික්තයක් පැවති අතර අතිරික්ත සේවක සංඛ්‍යාව අනුමත කරගෙන නොතිබුණි. | පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් විමසීම් කළ අවස්ථාවේ දී අමාත්‍යාංශ මට්ටමින් එය තුලනය කිරීමට ඉදිරියේ දී කටයුතු කරන බව දන්වා ඇත. | අතිරික්ත කාර්යය මණ්ඩලය අනුමතකරගත යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රාදේශීය සභාව විසින් පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය මඟින් ඇස්තමේන්තු කළ ආදායම් හා වර්ෂයේ තථ්‍ය ආදායම් අතර සියයට 5 සිට සියයට 100 දක්වා ද, ඇස්තමේන්තු කළ වියදම් හා වර්ෂයේ තථ්‍ය වියදම් අතර සියයට 3 සිට සියයට 99 දක්වා සැලකිය යුතු විචලනයන් පවතින බැවින් ආදායම් හා වියදම් පාලනයේදී අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි. | ඇස්තමේන්තුගත ආදායම්, වියදම් හා තථ්‍ය ආදායම් වියදම් අතර විචලනය ඉදිරි වර්ෂ වල දී අවම කර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි. | විචලනයන් අවම වන අයුරින් අයවැය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගත යුතුය. |